# ඈත වංගුව

## දාන පාරමිතාව

මේක පොඩි දන්සල් කතාවක්. වෙසක් පහු උනානේ. ලෝකේ කොහේ හිටියත් බෞද්ධයෝ වෙසක් එකට කරන නානාප්‍රකාර සැරසිලිවලට අමතරව කරන ප්‍රධානම දේ තමයි දන් දීම. කොහොමත් අපේ ජාතිය පැන පැන දෙන්නයි ගන්නයි බොහොම සූරයි. කොහොම උනත් වෙසක් පොසොන්වලට කරන සැරසිලි වලට වඩා දන්සැල් දීම වඩා වැදගත් කියලා චූටි මල්ලිටත් හිතෙනවා.



ලංකාවේ උනත් මේ පාර දන්සැල් ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකවත් වැඩි වෙලා කියලා දැනගන්න ලැබුනා. ඒක ප්‍රීතියට කාරණයක්. දැන් දන්සල් කිව්වම නානාප්‍රකාර ජාතියෙ ඒව තියෙනවනේ. ඉස්සර නම් ලේ දන්දීමයි බත් දන්සැල්නේ ප්‍රසිද්ධ. දැන්නම් දන්සැල් තුන්වේලම දෙනවළු. තේ වතුර කුරුම්බා වල ඉඳලා කිරිබත් රෝස්පාන් දක්වා ඒක පැතිරිලා. රෑට විතරක් දුන්න දන්සැල් දවස පුරාම දෙන එක කොයි තරම් දෙයක්ද? ඒ විතරක්යැ මේ පාර භූමිතෙල් පවා දීලා තිබුණා. ආ අර තව කවුද සල්ලිති බෙදලා තියෙනවා ලක්ෂ 50ක් තියෙන එවුන් නැති එවුන්ට දෙන එක කොයි තරම් දෙයක්ද දෙයියනේ. ඉතිං

දැං ඒක මේ රටවල්වලටත් ඇවිත්. ඉස්සර දන්සලක් දුන්නේ පන්සලේ විතරනෙ. දැන් අපේ ව්‍යාපාරික මහත්වරු නොයෙක් සමිති සමාගම් පන්සලෙන් එලියට ඇවිත් දන්සැල් පටන් අරන්. හොඳ වැඩ ඒවා.

මං අර කලින් කිව්වේ අපේ මිනිස්සු දෙන්න වගේම ගන්නත් හරි ශූරයි කියලා ඒක මට තේරුනේ මේ එක දන්සැලකට ගියාමයි. අපි කට්ටිය පෝලිමේ ටික දුරක් යනකොට දන්සැල අහවරයි. හේතුව මොකද මුලින් හිටපු කට්ටිය ගෙදර ඉන්න අයටයි බල්ලටයි පූසටයි හැමෝටම පාර්සල් ඔතාගෙන අරන් ගිහින්. කන්න ආපු මිනිස්සුන්ට බඩු නැහැ. බෙදන එකත් ක්‍රමේකට බෙදනවා වගේම ගන්න එකත් වාරෙකට ගන්න මිනිස්සු දැනගන්න එපායැ. මේවා ඉතිං අපිම හදාගන්න ඕනෙ දේවල්. මොකෝ දන්සැල් වලට නීති දාන්න පුළුවනෑ. මේක කන්න බොන්න නැති රටක්ද නිකම් දෙනවා නම් අපේ අය නොකන දෙයක් නැහැනෙ. කන්න නැති උන නිසා නෙවෙයි අපේ මිනිස්සුන්ගේ චරියාව ගැන දුක හිතලයි ලිව්වේ. මේවා සංවිධානය කරන උදවිය මේවා ගැන හොයලා බලලා අඩුපාඩු සකස් කරගන්න. වැඩි ගානට සැමට එකට සේ ලැබුනොත්නේ කාගේ කාගේත් සද්ධාව වැඩිවෙන්නේ. දන්සල් කියන්නේ දීලා දාන එක නෙවෙයි අප්පා ක්‍රමේකට දෙන එක.

## පොඩි ලෙඩක්

මේ රටේ වෛද්‍ය සේවාව ගැන පොඩි විචිකිච්ඡාවක් මට ඇති වුනේ පසුගිය දවසක අපේ මිත්‍රයෙකුගේ ආබාධයකට ප්‍රතිකාර ගන්න ගිහින්. ලොකු ලෙඩක් නොවෙයි මේ දත් කැක්කුමක්. දතක් නරක් වෙලා. දවස ඉරිදා. යාළුවගෙ දත ඇදුම් දෙනවා. ඇම්මට සෙනසුරාදා රෑ එළිවෙනකන් නිදි නෑ. ඔළුව පුපුරන්න වගේළු. පැනඩෝල් ඇමොක්සිලින් ඉඳලා පෙනඩින් වෙනකම් වේදනා නාශක ගත්තත් අහලා නෑ. ඉරිදා උදේ මං දකිනකොට මිනිහගේ මූනත් ඉදිමිලා. අමාරුව කටේ ඉඳලා කන හරහා මොළේ දක්වාම පැතිරිලා දත ගලවගන්න අපි වටේම ඩොක්ටර්ස්ලට කතා කලා. සේරම වහලා යෙලෝ පේජ්ස් අරගෙන ට්‍රයි කලා විශ්වාස කරන්න බෙරික්වල ඉඳලා සිටි එකට යනකම් තැන් දෙකයි ඉරිදා ඇරලා තිබුනේ. ඒකත් මොරබින් වල. අනෙක කාල්ටන් වල. ඒවාවල ගන්නෙත් ඇපොයින්මන්වලට විතරයි. පිස්සු හැදෙනවා. යන්න තැනක් නැහැ. අමාරුව කිව්ව එක තැනකින් කියනවා ඇපොයිමන්ට් එකට විතරක් ඩොලර් 100 යි ඩොක්ටර් ගාස්තුව අමරව අපට ලැබන චාන්ස් එක සුවර් නැහැ. ඉඩ තිබුනොත් දන්වන්නම් කියලා.

බැරිම තැන ගියා ඩැන්ඩිනොන් හොස්පිටල් එකට. ඉමර්ජන්සියෙන් කිව්වා දන්ත වෛද්‍ය පහසුකම් මෙහේ නැහැ. වේදනා නාශක අරන් සඳුදට දත ගලවන්න කියලා. මොනවා කරන්නද ආවා ආපහු යාළුවා එලිවෙනකම් අමර කට්ටක් කාලා පහුවෙනිදා ඩෙන්ටිස්



හමුවෙලා දත ගලවා ගත්තා. කතන්දරේ කිව්වම ඩෙන්ටිස් කියලා තියෙන්නෙත් එහෙම තමයි. මෙහේ හැටි ඉරිදට සේවය ගන්න නම් ටිකක් අමාරුයි. හදිසි සේවාව දෙන තැනක් තියෙනවා. හැබැයි 140 වැඩිට 400-450ක් අතර දෙන්න වෙනවා කියලා මොකද ඩෙන්ටිස් ඒ වෙනුවෙන්ම එන නිසාත් නර්ස්ට ගෙවන්න වෙන නිසාත් කියලා. කතාව ඇත්ත තමයි ඒත් මං කල්පනා කරන්නේ සාමාන්‍ය මිනිහෙකුට ඉරිදට අසනීප තත්වයක් ඇති වුනොත් ඩොලර් 400 විතර දතකට වියදම් කරන්න වෙනව නම් ඒ රටේ සෞඛ්‍ය සේවාවේ අඩුවක් නැද්ද කියලා මට පොඩ්ඩක් අවුල් වගේ මේක සාධාරනද. කවුරු හරි පොඩ්ඩක් පැහැදිලි කරනවද ?

## චරත භික්ඛවේ චාරිකං

මැයි මාසේ කියන්නේ වෙසක් මාසේ වගේම නකත් මාසයක් කියලත් කියනවනේ ලංකාවෙ නං බොහෝ සුබ කටයුතු කරන මාසයක් මේක. මිනිස්සු ධර්මය ගැනත් වෙනදට වැඩිය හිතන්න ගන්න කාලයක් මේක. ලෝකේ කොහේ හිටියත් බෞද්ධයන්ට මේක වැදගත් වෙන්නේ ඒක සංස්කෘතික උරුමයක් බවට පත්වී ඇති නිසයි. ඒ නිසා ඒ උරුමය රැකගන්න පවත්වගෙන යන්න කොයි දීපංකරේක හිටියත් සිංහල බෞද්ධයෝ ටිකක් සෙට් වුන ගමන් පොඩියට හරි පන්සලක් පටන් ගන්නවමයි. එහෙම පොඩියට පටන් ගන්න ඒවා තමයි ලෝකේ හැම රටකම වගේ තියෙන්නේ. එක පන්සලකින් පටන් අරන් කට්ටිය බෙදිලා ගිහින්. හැම ටවුන් එකකම පන්සල් හදන එක වෙනම ලියන්න ඕනෙ කතන්දරයක් . කොහොම වුනත් ඒ නිසාම ගමේ වැඩ හිඳපු හාමුදුරුවන්ට ලෝකෙ පුරාම යන්න අවස්ථාවක් ලැබිලා තියෙනවා. බුදු හාමුදුරුවොත් කිව්වෙත් බහු ජන සුඛය පිනිස චාරිකා කරන්න කියලනේ. ඒ නිසාම දැං ඔස්ට්‍රේලියාව පුරාම තියෙන පන්සල් වලට ලාංකික භික්ෂූන්ගේ අවශ්‍යතාව වැඩි වෙලා තියෙනවා.

මෙහේ වාසය කරන ලාංකික මිනිසුන්ගේ ධර්ම අවශ්‍යතාව ඉටුවීම කෙසේ උවත් ඒ අවශ්‍යතාවය හේතුකොටගෙන ගම්වල පන්සල්වලටම කොටුවෙලා හිටපු හාමුදුරුවන්ට ලෝකේ දකින්න තේරුම් ගන්න අවස්ථාවක් ලබල දෙන එක ගැන මගේ නම් තියෙන්නේ පුදුම සතුටක්.

ලෝකය ගැන යථා තත්වයෙන් දැන ගැනීම ධර්ම දේශනාවටත් මහත් පිටුවහලක් වෙනවා නොඅනුමානව. මොකද අපිත් රටින් පිටවෙන්න කලින් ලෝකය ගැන හිතාගෙන හිටියෙ කොයිතරම් වෙනස් විදියටද ? අපි ගැන එසේනම් පන්සල් වලම වැඩ වාසය කරන හාමුදුරුවන් ගැන කුමන කතාද ? ඒක හොඳට තේරුනේ පහුගිය දවසක බැලරාට්වලදී හමුවුන මෙහේ සංචාරයකට ආපු නැගෙනහිර පැත්තේ බොහොම දුර බැහැර පන්සලක හාමුදුරුවරු කිහිපනමක් නිසා. උන්වහන්සේලාගේ අදහස උනේත් මේ අවස්ථාව ලබාදීම ඉතා හොඳ වැඩක් වුවත් අවබෝධය සඳහා භාෂාව කඩුල්ලක් වී ඇති



බවයි. ඒකනම් ඉතා වැදගත් කාරනයක් බව අපිත් නොකර කතා පිලිගන්න ලෑස්තියි.

මේ ඉන්න අපේ පරම්පරාවට ධර්මය සිංහල භාෂාවෙන් තේරුම් කර දුන්නාට අපෙන් පසු මේවා පවත්වාගෙන යන්නට නම් ඉංග්‍රීසි භාෂාව දැනීම අත්‍යවශ්‍ය කාරනාවක්. තොග පිටින් මෙරටට භික්ෂූන් වැඩමවීමට පෙර ඔවුන් වෙනුවෙන් භාෂා ඉගැන්වීමට වැඩපිළිවෙලක් දැන්ම සිට ආරම්භ කලොත් හොඳයි කියලා තමයි අපිට නම් හිතෙන්නේ. ඒ සඳහා මේ පන්සල්වල වැඩ උන්න නායක ස්වාමීන් වහන්සේලාගේ අවධානය යොමුවනු ඇතැයි චූටි මල්ලි උදෙක්ම බලාපොරොත්තු වෙනවා. මෙහෙම ලියන්න හිතුනෙම අපේ හාමුදුරුවරු යම් යම් ස්ථානවලදී මුහුණපාපු අකරතැබ්බ දුටු නිසා ඇතිවුන සංවේගයකින්මයි.

## ඔස්ට්‍රේලියාව සුදානම්ද?

මැලේසියන් එයා යානයක් පැහැරගන්නට තැත් කළ ශ්‍රී ලාංකික තරුණයා පිලිබඳ කතාව ඔස්ට්‍රේලියාවෙ විතරක් නෙවෙයි මුලු ලෝකයේම ජනමාධ්‍ය වලට රසවත් තොරතුරක් වුණ හැටි අපි දැක්කා. හොඳ වෙලාවට ඒ තරුණයා මානසික ලෙඩෙක් හැටියට ප්‍රචාරය වුණේ. ඒකෙන් ලංකාවෙ නම පොඩ්ඩක් හරි බේරුණා. ඒත් මං මේ කතා කරන්න යන්නෙ ඒ පැහැර ගැනීම හරහා මතුවන වෙනත් ප්‍රශ්නයක් ගැනයි.

පැහැරගැනීමට ලක් වුණ යානයේ හිටිය මගීන් එකතු වෙලා කොල්ලකාරයාව



අල්ලාගෙන සිටියදීත් යානය මෙල්බන් ගුවන් තොටුපළට ගොඩබැස්සාට පසුව ඒ යානය තුළට ආරක්ෂක අංශ ඇතුල්වෙන්න පැය දෙකක් පමණ ගත්ත එක ගැන නම් චූටි මල්ලිට පුදුමයි. ආරක්ෂක අංශ නිසි "ප්‍රොටොකෝල්ස්" අනුව කටයුතු කර ඇති බැවින් ඔවුන් නිවැරදි යයි ලොකු තැන්වලින් කියැවුණා. ඒ ප්‍රොටොකෝල්ස් අනුව මෙවැනි අවස්ථාවක ක්‍රියාත්මක වෙන්න පැය දෙකක් යනවා නම් ඒ ප්‍රොටොකෝල්ස් ගැන නැවත හිතා බලන්න වෙනවා කියන එකයි මගේ නම් අදහස.

මෙහෙම දේවල් මේ රටේ වුණ පළමු අවස්ථාව මෙය නෙවෙයි. එකම එක ත්‍රස්තවාදියෙක් සිඩ්නි නුවර "ලින්ඩො" අවන්හල ඇතුලේ ප්‍රාණ ඇපකරුවන් හිරකරගත්ත අවස්ථාවේදීත් ආරක්ෂක අංශ පැය ගණන් ගත කරලා අන්තිමේදී ප්‍රාණ ඇපකරුවන් දෙන්නෙක්ගෙ ජීවිතත් අහිමි වුණා. එපමණක් නෙවේ. මෙල්බන් නගරයේ අතිශයම ජනාකීර්ණ ෆ්ලින්ඩර්ස් ස්ට්‍රීට් ස්ටේෂම ඉස්සරහා කාරයක නැගිලා වැඩ පෙන්නපු කොල්ලා දිහා ආරක්ෂක අංශ බකංනිලාගෙන බලාගෙන ඉඳලා අන්තිමේදී ජීවිත පහ හයක්ම අහිමි කළා නේද?

චූටි මල්ලිට හිතෙන විදිහට නම් ඔස්ට්‍රේලියාවේ ආරක්ෂක අංශ ත්‍රස්තවාදී උවදුරු සඳහා සූදානම් කර තිබෙන ආකාරය ගැන නම් සෑහීමකට පත්වෙන්න බැහැ. මෙහෙම ගියොත් මෙයිට වඩා විශාල අනතුරකදී අති විශාල මිනිස් ජීවිත ගණනාවක් විනාශවන බව නම් සත්‍යයි. මේ කාරනා ගැන වගකිවයුත්තන් මෙයිට වඩා ගැඹුරින් කල්පනා කරනවා නම් පුරවැසියන් වෙච්ච අපේ වාසනාවක්.

**චූටි මල්ලි**